සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade : 08 | විෂයය / பாடம் / Subject : පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper : I, II | කාලය / காலம் / Time : පැය 02 |

නම :- ........................................................................................ විභාග අංකය :- ...........................

**සැලකිය යුතුයි:**

- I පත්‍රයේ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.
- II පත්‍රයට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා පළමු පත්‍රයේ පිළිතුරු පත්‍රයට අමුණා භාරදෙන්න.

---

**I පත්‍රය**

- **ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රකාශන නිවැරදි නම් "✓" ලකුණ ද, වැරදි නම් "×" ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

(01) ජනතාවගේ ජීවන තත්වයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණින් පොදු සේවා පවත්වා ගෙන යයි. (     )

(02) පාරිසරික සෞඛ්‍යය ආරක්ෂා කිරීම, ඩෙංගු වැනි රෝග මර්දනය සඳහා පොලීසිය සහාය වේ. (     )

(03) පවුල හැරුණු විට දරුවෙකුට සමීපතම ආයතනය වන්නේ පන්සලයි. (     )

(04) මහම්මත් නබිතුමාගේ උපන්දිනය සිහිකරමින් දුගී මගී යාචකයන්ට දන්දීම රාමසාන් උත්සවයේ දී ප්‍රධාන වශයෙන් සිදුවේ. (     )

(05) රෝද දෙකේ අත් ට්‍රැක්ටරය අතීත මිනිසා භාවිතා කළ පරිසර හිතකාමී උපකරණයකි. (     )

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දී ඇති වචන ලැයිස්තුවෙන් ගැලපෙන වචනය තෝරා හිස්තැන මත ලියන්න.**

(06) බෝ නොවන රෝග වැලැක්වීම අරමුණු කරගෙන ප්‍රාථමික සෞඛ්‍යය සේවා සැපයීම සඳහා දිවයින පුරා ............................................. පිහිටුවා තිබේ.

(07) පොදු සේවා භුක්ති විඳීම සම්බන්ධයෙන් පුරවැසියන් තම ............................................. ඉටුකිරීම පොදු සේවාවල ගුණාත්මක සංවර්ධනයට හේතු වේ.

(08) චිත්තවේග සුහවාදීව හසුරුවා ගැනීම පුද්ගල ජීවිතයට මෙන් ම තමන්ගේ ............................................. හේතු වේ.

Department of Education – Western Province

(09) මිනිසාට වඩා ඉක්මනින් සතුන්ට ............................................. වෙනස්වීම් හඳුනා ගැනීමේ හැකියාවක් ඇත.

(10) තමන් කරන කාර්යය සතුටින් හා කැමැත්තෙන් යුතුව ඉටු කිරීම ............................................. නම් වේ.

(රෝහල් , සුවදිවි මධ්‍යස්ථාන , යුතුකම් , අයිතිවාසිකම් , යහපතට , ලෝකයේ , පරිසරයේ , ශ්‍රමාභිමානය , කාර්යක්ෂමතාව)

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට A කොටසේ දක්වා ඇති ප්‍රකාශයට ගැළපෙන ප්‍රකාශ B කොටසින් තෝරා යාකරන්න.**

| | A | B |
|---|---|---|
| (11) | දරුවන්ගේ අයිතීන් හා අදාළ සියළු සේවාවන් හා සම්බන්ධීකරණ සහායක් ලබා දීම | මානසික ශ්‍රමය යෙදවීම |
| (12) | ගැටුම්කාරී අවස්ථාවකට හේතුවන සාධකයකි. | ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි |
| (13) | වැඩි වශයෙන් මනස හෙවත් මොළය වෙහෙසා කරන රැකියා | වැරදි වැටහීම |
| (14) | වැඩ ලෝකය ක්‍රියාත්මක වන ස්ථානය | ආපදා කලමනාකරණ මධ්‍යස්ථානය |
| (15) | අනතුරු හා ආපදා සම්බන්ධව කටයුතු කරන ආයතනයකි. | සේවා ස්ථානය |

Department of Education – Western Province

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(16) A. සමාජ සබඳතා පුළුල්වීම
B. ජාත්‍යන්තර සබඳතා දියුණු වීම
ඉහත සාධක හේතුවෙන් වර්තමානයේ අත්‍යවශ්‍ය සේවාවක් වී ඇති සේවාව
(1) පණිවුඩ හුවමාරු සේවා (2) ආරක්ෂක සේවා
(3) විදුලිය සේවා (4) ප්‍රවාහන සේවා

(17) පරිසර සංරක්ෂණය සඳහා රජය මගින් පිහිටුවා ඇති ආයතනයක් නොවන්නේ,
(1) පරිසර අමාත්‍යාංශය
(2) මධ්‍යම පරිසර අධිකාරිය
(3) වන ජීවී දෙපාර්තමේන්තුව
(4) නාගරික සංවර්ධන අධිකාරිය

(18) එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතියට අනුව ළමයින් ලෙස පිළිගැනෙන්නේ,
(1) අවුරුදු 14ට අඩු දරුවන් ය. (2) වසය අවුරුදු 6-14 අතර දරුවන් ය.
(3) අවුරුදු 21ට අඩු දරුවන් ය. (4) අවුරුදු 18ට අඩු දරුවන් ය.

(19) මනස සන්සුන් කිරීමේ අභ්‍යාසයකි.

(1) සෞන්දර්ය ක්‍රියාකාරකම්වල නිරත වීම

(2) කාල සටහනකට අනුව වැඩ කිරීම

(3) චාරිකා යෑම

(4) භාවනා කිරීම

(20) පෘථිවි අභ්‍යන්තරයේ ඇතිවන භෞතික ක්‍රියාවලි නිසා හටගන්නා ස්වභාවික විපතක් නොවන්නේ,

(1) සුනාමි (2) භූමිකම්පා

(3) ගංවතුර (4) භූ චලන

(ලකුණු 20 x 2 = 40)

## II පත්‍රය

- පළමු ප්‍රශ්නයට පිළිතුරු ලිවීම අනිවාර්යය වේ.
- තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 5කි.

Department of Education – Western Province

(01) (1) රජය විසින් ඔබට නොමිලේ සපයනු සේවා දෙකක් ලියන්න.

(2) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කර ඇති විශේෂ සේවා 2ක් ලියන්න.

(3) පරිසර සංරක්ෂණය සඳහා රජය මගින් පිහිටුවා ඇති ආයතන දෙකක් නම් කරන්න.

(4) නායකයෙකු සතු විය යුතු සන්නිවේදන හැකියා 2ක් ලියන්න.

(5) බහු සංස්කෘතික ලක්ෂණ ක්‍රියාත්මක වන රටවල් 2ක් දක්වන්න.

(6) ස්වභාවික හෝ මිනිස් ක්‍රියාකාරකම් නිසා ආපදා හා විපත් ඇති වූ විට දැනුම් දිය යුතු ආයතන දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 2 × 6 = 12)

(02) (1) සමාජයීය පුරවැසියෙකු වශයෙන් ඔබ භුක්ති විඳින පොදු සේවාවන් 3ක් නම් කරන්න.

(ලකුණු 03)

(2) පොදු සේවාවක් ලෙස පානීය ජලය සැපයීම අවශ්‍යවීමට හේතු 4ක් ලියන්න.

(ලකුණු 04)

(3) ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක නායකයෙකු සතු විය යුතු ගුණාංග 3ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(03) (1) පහත සඳහන් ස්ථාන ආශ්‍රිතව ඇති විය හැකි අනතුරු 1 බැගින් ලියන්න.

A. නිවාස ආශ්‍රිතව

B. මහා මාර්ග ආශ්‍රිතව

C. කම්හල් ආශ්‍රිතව (ලකුණු 03)

(2) අනතුරු හා ආපදා සම්බන්ධව කටයුතු කරන ආයතන 4ක් සඳහන් කරන්න. (ලකුණු 04)

(3) අනතුරක් සිදු වූ විට නීතිගරුක පුරවැසියන් ලෙස අප ක්‍රියාකල යුත්තේ කෙසේදැයි කෙටියෙන් ලියන්න. (ලකුණු 05)

(04) (1) ළමා අයිතිවාසිකම් දෙකක් හා ඒවා බැඳුණු යුතුකම් 1ක් නම් කරන්න. (ලකුණු 03)

(2) ළමා අයිතිවාසිකම් ප්‍රධාන තේමා 4ක් යටතේ දක්වා ඇත. එම තේමා 4 ලියා දක්වන්න. (ලකුණු 04)

(3) ප්‍රජාතන්ත්‍රවාදී දිවි පැවැත්මට අදාළ ගුණාංග 3ක් කෙටියෙන් ලියන්න. (ලකුණු 05)

(05) (1) එදිනෙදා ජීවිතයේ දී ඔබට හෝ ඔබගේ යහළුවෙකුට මුහුණ දීමට සිදු වූ අභියෝග 3ක් නම් කරන්න. (ලකුණු 03)

(2) එවැනි එක් අභියෝගයක් සඳහා සාර්ථකව මුහුණ දීමට ගත හැකි ක්‍රියාමාර්ග 4ක් යෝජනා කරන්න. (ලකුණු 04)

(3) අභියෝග ජය ගැනීමට ප්‍රගුණ කළ යුතු මනෝ සමාජයීය නිපුණතා 05ක් නම් කරන්න. (ලකුණු 05)

(06) (1) වැඩ ලෝකය පිළිබඳ ටිව්ලර්ගේ නිර්වචනය පැහැදිලි කරන්න. (ලකුණු 03)

(2) වැඩ ලෝකය හා සම්බන්ධ පහත සඳහන් එක් එක් මාතෘකා යටතේ එක් වෘත්තීය තත්වය බැගින් නම් කරන්න.

A. කෘෂිකාර්මික

B. කාර්මික

C. ස්වයං රැකියා


D. සේවා - (ලකුණු 04)


(3) හොඳ සේවකයෙකු තුළ තිබිය යුතු ගුණාංග 05ක් දක්වන්න. (ලකුණු 05)

Department of Education – Western Province

(07) (1) පහත A, B, C ලෙස සඳහන් මාර්ග සංඥා වලින් කියවෙන අදහස් ලියන්න.


A


B


C (ලකුණු 03)

(2) වගා කටයුතුවල දී රසායනික ද්‍රව්‍ය හා පලිබෝධ නාශක භාවිතය මිනිසාට අහිතකර විය හැකි අවස්ථා 4ක් දක්වන්න. (ලකුණු 04)

(3) ශ්‍රම අභිමානයෙන් යුතුව කටයුතු කිරීම තුළින් සේවා යෝජකයාට හා සේවාලාභියාට අත්වන ප්‍රයෝජන දෙකක් ලියා දක්වන්න. (ලකුණු 05)